# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2140/17 - 2019 සැප්තැම්බර් මස 10 වැනි අඟහරුවාදා - 2019.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 3/2012 III

### 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (3), (6) සහ (7) වන උපවගන්ති සමග සහ 50 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදෙස් මත, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ජොන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 අංක 01 දරන සංචාරක (නියාමක සේවා) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කිසිම තැනැත්තකු විසින් සංචාරක නියමු කථිකාචාර්යවරයකුගේ සේවාවක්, මෙහි 2(2) නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති අදාළ සංචාරක නියමු කථිකාචාර්ය ප්‍රභේදය යටතේ (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇත්නම් සහ අධිකාරියෙන් එම සේවාව සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස, පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) සෑම සංචාරක නියමු කථිකාචාර්යවරයකු ම, ඔවුන් විසින් ඉටුකිරීමට බලයලත් සේවාවන්ගේ පදනම මත පහත පරිදි ප්‍රභේද හතරකට නම් කරනු ලැබිය යුතු ය :-

(*අ*) ජාතික සංචාරක නියමු කථිකාචාර්ය ;
(*ආ*) සංචාරක නියමු කථිකාචාර්ය - රියදුරු ;
(*ඇ*) ප්‍රාදේශීය සංචාරක නියමු කථිකාචාර්ය ; සහ
(*ඈ*) ස්ථානීය සංචාරක නියමු කථිකාචාර්ය.

(3) සෑම සංචාරක නියමු කථිකාචාර්යවරයකු සතුවම මෙහි I වන සහ II වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති අවම අවශ්‍යතා සහ සුදුසුකම් අදාළ පරිදි තිබිය යුතු ය.

## I වන කොටස

## සංචාරක නියමු කථිකාචාර්යවරයන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම

3. මේ නියෝග යටතේ සංචාරක නියමු කථිකාචාර්යවරයකුගේ සේවාවක් පවත්වාගෙන යාමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු විසින් ම :-

(අ) ලියාපදිංචි වීම සහ බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර වෙන වෙනම (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතිවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ 2018 මැයි මස 16 දින අංක 2071/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු එම අයදුම්පත සමග ගෙවනු ලැබිය යුතු ය ;

(ඇ) අයදුම්කරු සංචාරක නියමු කථිකාචාර්වරයකු ලෙස කටයුතු කිරීම සඳහා මානසිකව සහ ශාරීරිකව සුදුසු බවට සහතික කරමින් ලියාපදිංචි රජයේ වෛද්‍ය නිලධරයකු විසින් නිකුත් කරන ලද වලංගු වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ඈ) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා ජාතික සංචාරක නියමු කථිකාචාර්ය ආයතනය හෝ අධිකාරිය විසින් බලය පවරන ලද වෙනත් යම් පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන, වාර්ෂිකව අවම වශයෙන් පැය 32 ක් දක්වා වූ සංචාරක නියමු සේවාව පිළිබඳ පුහුණුව සහ කුසලතා සංවර්ධනය සාර්ථකව අවසන් කළ බවට වූ වලංගු සාක්ෂියක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ඉ) වරදකට වරදකරුවකු බවට පත්නොවී ඇති බවට පොලිස් සහතිකයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. එම ඉල්ලීම තීරණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලැබිය හැකි යම් පැහැදිලි කිරීම් ද ඇතුළුව තවදුරටත් වූ තොරතුරු හෝ ලේඛන සපයන ලෙස ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

5. සාවද්‍ය, නොමග යවන සුළු හෝ අසත්‍ය තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට අනාවරණය කරගනු ලබන යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

6. මෙහි I වන සහ II වන උපලේඛනවල සඳහන් අවශ්‍යතා සහ සුදුසුකම් අදාළ පරිදි අයදුම්කරු සතුව පවතින බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, ඔහු එම අයදුම්කරු ලියාපදිංචි සංචාරක නියමු කථිකාචාර්යවරයකු ලෙස ලියාපදිංචි කළ යුතු අතර, එම අයදුම්කරු වෙත බලපත්‍ර ලබා දීම කරගෙන යා යුතු ය.

7. ලියාපදිංචි සංචාරක නියමු කථිකාචාර්යවරයකුගෙන්, බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ අයදුම්පතක් ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එම බලපත්‍රය නිකුත් කිරීම සඳහා එම අයදුම්පතට අදාළව තවදුරටත් වූ තොරතුරු, ලේඛන හෝ පැහැදිලි කිරීම්, නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස එම අයදුම්කරුට විධාන කරනු ලැබිය හැකි ය.

8. (1) මෙහි I වන සහ II වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති අවම අවශ්‍යතා සහ සුදුසුකම් එම අයදුම්කරු සතුව පවතින බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසුව, ඔහු විසින් එම අයදුම්කරු වෙත සංචාරක නියමු කථිකාචාර්යවරයකු ලෙස සේවය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය තීරණය එක් මාසයක කාලයක් ඇතුළත අයදුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර, බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් ඒ පිළිබඳ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

9. මේ නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රය -

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට එකඟව යථා පරිදි ක්‍රියාකිරීම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත බවට සලකනු ලබන, බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත් විය හැකි ය ;

(ආ) එහි නිශ්චිතව දක්වා ඇති දිනයේ දී බලාත්මක විය යුතු ය ; සහ

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් මිස, එම බලපත්‍රයේ නිශ්චිතව සඳහන් දිනයේ සිට වසරක කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

## II වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

10. සංචාරක නියමු කථිකාචාර්යවරයකු වශයෙන් සේවය කිරීමේ දී කිසිදු තැනැත්තකු විසින් මෙම නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් කාර්යයක් සඳහා ද එම කාර්යය හැරුණු කොට වෙනත් කිසිදු කාර්යයක් සිදු නොකළ යුතු ය.

11. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධිකාරියේ අනුමතය ඇතිව, මෙම නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයට අමුණා ඇති යම් නියමයක් හෝ කොන්දේසියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

12. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන හේතු මත, එනම් -

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කර තිබීම හේතුවෙන් ;

(ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කර තිබීම හේතුවෙන් ; හෝ

(ඇ) මේ නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයට අමුණා ඇති යම් කොන්දේසියක් සමග එකඟව ක්‍රියාකර නොමැති වීම හේතුවෙන්,

මේ නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

13. මේ නියෝගවල 8 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආකෘතියකට අනුකූලව ඔහු වෙත අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් ;

(ආ) බලපත්‍රයේ කල් ඉකුත් වීමට පෙරාතුවම වූ මාස තුනකට වඩා වැඩි නොවන කාලයක් තුළ දී ; සහ

(ඇ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ 2018 මැයි මස 16 දින සහ අංක 2071/57 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ප්‍රකාරව ගෙවිය යුතු ගාස්තු ගෙවීමේ දී,

අලුත් කරනු ලැබිය යුතු ය.

14. බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ බලපත්‍රයක් අවලංගු කිරීමක් පිළිබඳ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි එම බලපත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳව දැනුම් දෙමින් ලිඛිත නිවේදනයක් ලැබීමේ දින සිට මාස එකක කාලයක් ඇතුළත, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 51 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විනිශ්චයාධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

15. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘතියෙන් වූ ලියාපදිංචි සහ බලපත්‍රලාභී සංචාරක නියමු සේවාවන් පිළිබඳ විස්තර අන්තර්ගත සංචාරක නියමු කථිකාචාර්ය සේවාවන් පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

16. විරල භාෂාවල ප්‍රවීණතාව ලබා ඇති අයට වැඩි සැලකිල්ලක් දැක්වීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් වෙළඳපොළ ඉල්ලුම සලකා බලමින් විරල භාෂා තීරණය කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### සේවා නියම සහ කොන්දේසි

17. අධිකාරිය විසින් එක් එක් බලපත්‍රලාභී සංචාරක නියමු කථිකාචාර්යවරයකු වෙත වලංගු හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබිය යුතු අතර, රාජකාරියේ යෙදෙන විටදී, තම හැඳුනුම්පත ප්‍රදර්ශනය වන පරිදි තමා සන්තකයේ තබා ගැනීම සංචාරක නියමු කථිකාචාර්යවරුන්ගේ කාර්යය විය යුතු ය.

18. සෑම බලපත්‍රලාභී සංචාරක නියමු කථිකාචාර්යවරයකු විසින්ම රාජකාරියේ යෙදෙන විටදී, අධිකාරිය විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් රැගෙන යා යුතු ය.

19. ජාතික සංචාරක නියමු කථිකාචාර්යවරයකු ඔවුන් සමග යන සංචාරක කණ්ඩායම සමග චාරිකාව මුළුල්ලෙහිම රැඳී සිටිය යුතු අතර, එම සංචාරක කණ්ඩායමට නවාතැන් පහසුකම් සපයනු හෝටලය විසින්ම, සංචාරක කණ්ඩායම රැගෙන යන එකී ජාතික සංචාරක නියමු කථිකාචාර්යවරුන් වෙත ද සංචාරක කණ්ඩායමට ලබා දුන් නවාතැන් පහසුකම් හා සමාන නවාතැන් පහසුකම් ලබා දිය යුතු ය.

20. මෙම නියෝගවල විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, මේ නියෝග බලපවත්වනු ලබන දින වන විටත් සංචාරක නියමු සේවාවක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකුට, මෙම නියෝග බලපවත්වනු ලබන දින සිට මාස හයක් ඇතුළත අධිකාරියේ ලියාපදිංචි විය යුතු බවට නියෝග කරනු ලැබේ.

21. මෙම නියෝගවල -

''ප්‍රාදේශීය සංචාරක නියමු කථිකාචාර්ය'' යන්නෙන් ප්‍රාදේශීය සංචාරක නියමුවකු ලෙස නිසි පරිදි ලියාපදිංචි වූ සහ හතකට නොවැඩි ආසන පහසුකමකින් යුත් රථවාහනයක් සමග බලපත්‍රයේ නිශ්චිතව සඳහන් ප්‍රදේශය/ප්‍රදේශ ඇතුළත පමණක් සංචාරක නියමුවකු ලෙස ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් බලය පවරන ලද යම් තැනැත්තකු අදහස් වේ ;

''සංචාරක නියමු කථිකාචාර්ය - රියදුරු'' යන්නෙන්, සංචාරක නියමු රියදුරකු ලෙස නිසි පරිදි ලියාපදිංචි වූ සහ හතකට නොවැඩි ආසන පහසුකමකින් යුත් රථවාහනයක් සමග ශ්‍රී ලංකාවේ ඕනෑම කොටසක සංචාරක නියමුවකු ලෙස ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් බලය පවරන ලද යම් තැනැත්තකු අදහස් වේ ;

''ජාතික සංචාරක නියමු කථිකාචාර්ය'' යන්නෙන් ජාතික සංචාරක නියමුවකු ලෙස නිසි පරිදි ලියාපදිංචි වූ සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් ජාතික සංචාරක නියමුවකු ලෙස ශ්‍රී ලංකාවේ ඕනෑම කොටසක් තුළ ක්‍රියා කිරීමට බලය පවරන ලද යම් තැනැත්තකු අදහස් වේ ;

''ස්ථානීය සංචාරක නියමු කථිකාචාර්ය'' යන්නෙන්, ස්ථානීය සංචාරක නියමුවකු ලෙස නිසි පරිදි ලියාපදිංචි වූ සහ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් ප්‍රදේශය/ප්‍රදේශ ඇතුළත පමණක් සංචාරක නියමුවකු ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් බලය පවරන ලද යම් තැනැත්තකු අදහස් වේ ;

''සංචාරක නියමු කථිකාචාර්ය'' යන්නෙන්, ජාතික සංචාරක නියමු කථිකාචාර්යවරයකු, සංචාරක නියමු කථිකාචාර්ය - රියදුරකු, ප්‍රාදේශීය සංචාරක නියමු කථිකාචාර්යවරයකු හෝ ස්ථානීය සංචාරක නියමු කථිකාචාර්යවරයකු වශයෙන් සංචාරක නියමු සේවා සපයනු ලබන හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ ; සහ

''සංචාරක නියමු සේවාව'' යන්නෙන්, සංචාරකයින්ට මග පෙන්වීමෙන් ද ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ශන ඇති සියලු අංශවලට අදාළව තොරතුරු හා විස්තර ඔවුන්ට සපයා දෙමින් ද, සංචාරකයන්ට සපයන්නා වූ සේවාවක් අදහස් වේ.

## I වන උපලේඛනය

(6 වන සහ 8 වන නියෝග)

**සංචාරක නියමු කථිකාචාර්ය සේවාවක් ලියාපදිංචි කිරීම සඳහා වූ අවම අවශ්‍යතා**

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

2. අයදුම්පත භාර ගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුගේ වයස අවු. 21 ට නොඅඩු සහ අවු. 60 ට නොවැඩි විය යුතු ය.

3. අයදුම්කරු ඉංග්‍රීසි හෝ වෙනයම් විදේශ භාෂාවක/භාෂාවල ප්‍රවීණතාවය ලබා තිබිය යුතු ය.

4. සියලු ප්‍රභේදවලට අයත් සංචාරක නියමුවන් සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් ඉතිහාසය, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව, පුරා විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, අන්තර්ජාතික සබඳතා යනා දී විෂයයන් හෝ සංචාරක කටයුතුවලට අදාළ වෙනයම් විෂයක් පිළිබඳ උපාධියක් ලබා ඇති තැනැත්තන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

5. සංචාරක නියමුවකුගේ සේවාවන් සැපයීම සඳහා අයදුම්කරු, රජයේ නිසි වෛද්‍ය නිලධරයකු විසින් නිකුත් කරන ලද මානසික හා ශාරීරික යෝග්‍යතා සහතිකයක් ලබා තිබිය යුතු ය.

6. කිසිදු වරදක් සඳහා වරදකරු වී නොමැති බවට අයදුම්කරු විසින් පොලිස් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

7. අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන තේරීම් පරීක්ෂණයක දී, සම්මුඛ පරීක්ෂණයක දී සහ භාෂා නිපුණතා පරීක්ෂණයක දී දක්වනු ලබන කුසලතාව මත පදනම්ව තෝරා ගැනීම කළ යුතු ය.

## II වන උපලේඛනය

(2 වන 6 වන සහ 8 වන නියෝග)

අවම සුදුසුකම් :

1. ජාතික සංචාරක නියමු කථිකාචාර්යවරයකු (ඉංග්‍රීසි භාෂාවෙන් අමතන) සඳහා :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සියලු විෂයයන් සමත් වී තිබිය යුතු ; හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබිය යුතු ය ; සහ

(ඇ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වන ලද ජාතික සංචාරක නියමුවන්ගේ පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර තිබිය යුතු ය ; සහ

(ඈ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලබා තිබිය යුතු ය.

2. ජාතික සංචාරක නියමු කථිකාචාර්යවරයකු (ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂා) සඳහා :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සියලු විෂයන් සමත් වී තිබිය යුතු ය ; හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබිය යුතු ය ; සහ

(ඇ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පිළිගත් සහ නියම කරන ලද ආයතනයක් විසින් නිකුත් කරන ලද, සංචාරක නියමුවකු වශයෙන් ක්‍රියා කිරීමට බලාපොරොත්තු වන්නා වූ භාෂාවේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු ය ; හෝ

(ඈ) එකී භාෂාව, ස්වභාෂාව වන්නා වූ දේශයක අවම වශයෙන් වසර පහක් වාසය කිරීමේ හා වෘත්තියක නියැලීමේ සහතික ඉදිරිපත් කිරීම මගින් සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පිළිගත් ආයතනයක් විසින් පවත්වන ලද භාෂා නිපුණතා පරීක්ෂණයක් සාර්ථකව නිම කිරීම මගින් භාෂා ප්‍රවීණතාව සනාථ කළ යුතු ය ;

(ඉ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වන ලද ජාතික සංචාරක නියමු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර තිබිය යුතු අතර, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් තිබිය යුතු ය.

3. සංචාරක නියමු කථිකාචාර්ය - රියදුරු සඳහා :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් සහිතව සමත් වී තිබිය යුතු ය ;

(ආ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වන ලද සංචාරක නියමු කථිකාචාර්ය - රියදුරන්ගේ පාඨමාලාව සාර්ථකව නිම කර තිබිය යුතු ය ;

(ඇ) සුදුසු අධිකාරයක් විසින් නිකුත් කරන ලද සත් දෙනෙකු සඳහා ආසන පහසුකමකින් යුතු රථවාහනයක් පැදවීම සඳහා වලංගු බලපත්‍රයක් සහ අවම වශයෙන් එකී රථවාහනය පැදවීමේ පස් වසරක පළපුරුද්දක් තිබිය යුතු ය ;

(ඈ) වලංගු බලපත්‍රයක් සහිතව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය සංචාරක නියමුවරයකු වශයෙන් පස් අවුරුදු අඛණ්ඩ යහපත් සේවා වාර්තාවක්, ලියාපදිංචි සංචාරක නියමු රියදුරකු බවට පත් වීම සඳහා අදාළ කර ගත හැකි ය.

4. ප්‍රාදේශිය සංචාරක නියමු කථිකාචාර්යවරයකු සඳහා :-

(අ) අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් හතරක් සමත් වී තිබිය යුතු ය ;

(ආ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වන ලද ප්‍රාදේශීය සංචාරක නියමුවන්ගේ පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර තිබිය යුතු ය ; හෝ

(ඇ) මෙම කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිසි පරිදි පිළිගත් හා එමගින් බලය පවරන ලද යම් ආයතනයක් විසින් පවත්වන ලද වෙනයම් පුහුණුවක් සාර්ථකව නිම කර තිබිය යුතු ය ;

(ඈ) බලයලත් ප්‍රදේශය පිහිටා ඇති පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු විය යුතු ය.

5. ස්ථානීය සංචාරක නියමු කථිකාචාර්යවරයකු සඳහා :-

(අ) අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් හතරක් සමත් වී තිබිය යුතු ය ;

(ආ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වන ලද ස්ථානීය සංචාරක නියමුවන්ගේ පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර තිබිය යුතු ය ; හෝ

(ඇ) මෙම කාර්යය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිසි පරිදි පිළිගත් හා එමගින් බලය පවරන ලද යම් ආයතනයක් විසින් පවත්වන ලද වෙන යම් පුහුණුවක් සාර්ථකව නිම කර තිබිය යුතු ය.

2019.04.08

09 - 798

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.